තුම්පනේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු පුස්තකාල 05 ක් සඳහා ලද පොත් වටිනාකම රු.233,677 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පොත්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජ'නල් සටහනකින් නිවැරදි කර ඇත. |
| (ආ) | අපහරණය කරන ලද පුස්තකාල පොත්වල වටිනාකම රු.190,275 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අපහරණය කළ පුස්තකාල පොත්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජ'නල් සටහනකින් නිවැරදි කර ඇත. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව, ගොඩනැගිලි 02 ක අගය රු.7,356,291 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජ'නල් සටහනකින් නිවැරදි කර ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ රු.460,545 ක වියදමක් දරා ඉදිකර තිබූ ගොඩනැගිලි 02 ක් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම්වල වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජ'නල් සටහනකින් නිවැරදි කර ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.183,911 ක පොලිය වෙනත් ආයෝජන යටතේ දක්වා තිබුණි. | ශේෂ පත්‍ර අයිතම නිවැරදි ආකෘතිය යටතේ දැක්විය යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් අයිතම 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව, ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.55,090 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතු වේ. | එක් වෙනසක් ජ'නල් සටහනක් මඟින් නිවැරදි කර ඇති අතර, අනෙක් වෙනස පිළිබඳව පරීක්ෂා කර බලමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 05 ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.454,864 ක් වී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 01 ත් 05 ත් අතර ගෙවිය යුතු ශේෂවල එකතුව රු.16,603,588 ක් වී තිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටුවේ දී, ප්‍රගතිය ඉදිරිපත් කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛන, ඔප්පු, පැවරුම් නියෝග හා තොග ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.46,065,918 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | අතැති තොග භාණ්ඩ සමීක්ෂණය මාසයක් තුළ සිදු කර වාර්තා කරන අතර, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු වත්කම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>----------------------<br>219(1) හා (2) වගන්ති | සභාවේ සභිකයෙකුට ප්‍රාදේශීය සභාව සමඟ මූල්‍ය හෝ ගිවිසුම්ගත සම්බන්ධතාවයක් සෘජුව හෝ අනාන්‍යාකාරයකින් නොතිබිය යුතු නමුත්, 2015 වර්ෂයේ දී, සභාපති හා සභිකයින් 02 කු ගිවිසුම්ගතව කඩ කාමර 05 ක් පවරා ගෙන තිබුණි. | ප්‍රාදේශීය සභා පනතට අනුකූලව ක්‍රියා කළ යුතු වේ. | සභාවේ සභිකයින් දෙදෙනෙකු සභාව සතු කඩ කාමර ගිවිසුමට එළඹ ඇති බව පිළිගෙන ඇත. හිටපු සභාපති හා තවත් 03 කු ගිවිසුම්ගත වූ කඩ කාමර 03 ක් තම පුතාගේ, භාර්යාවගේ හා මවගේ නමින් පවරා ගෙන ඇති බව සනාථ කිරීම සඳහා සභාව සතුව ලේඛනගත සාක්ෂි නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය<br>---------------------------- | | | |
| (i) | මූ.රී.59 හා 61 | සමාලෝචිත වර්ෂය සඳහා සහා බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | බල ප්‍රදේශය තුළ පිහිටි ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධව වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා සමීක්ෂණය කර ඇත. |
| (ii) | මූ.රී.177 හා 178 | වෙනත් ප්‍රාදේශීය සභාවක් විසින් අවිධිමත් ලෙස කැඳ වූ මිල පදනම් කර ගෙන සභාවට අවශ්‍ය කාර්යාල උපකරණ මිල දී ගෙන තිබුණි. | සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන පරිපාටියක් අනුගමනය කළ යුතු වේ. | තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව, මිල දී ගෙන ඇත. |
| (iii) | මූ.රී.218 | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | වත්කම් සමීක්ෂණය කර, ඒ පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුවේ දී, ප්‍රගතිය ඉදිරිපත් කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විවිධ කාර්යයන් සඳහා ලබා දුන් අත්තිකාරම් 04 ක් වර්ෂ 04 සිට වර්ෂ 10 ක කාලයක් තුළ පියවා නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී දින 10 ක් ඇතුළත පියවිය යුතු වේ. | ඉදිරියේ දී, අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කරමි. |
| (ii) | මු.රෙ.571 | 2010 සිට අවස්ථා 10 කදී ලැබී කල් ඉකුත් වූ තැන්පත් නිරවුල් කර නොතිබුණි. | ඉකුත් තැන්පතු නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මු.රෙ.571 ප්‍රකාරව, කටයුතු කරමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,929,746 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,666,137 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,052,000 | 4,812,161 | 3,643,817 | 2,847,123 | 2,980,000 | 4,253,428 | 3,376,362 | 2,129,228 |
| (ii) | කුලී | 4,973,000 | 5,232,842 | 4,691,325 | 704,552 | 5,155,000 | 3,000,268 | 2,882,981 | 924,297 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,695,500 | 2,409,146 | 2,469,146 | -- | 2,764,000 | 1,533,043 | 1,533,043 | -- |
| (iv) | වෙනත් ආදායම් | 9,909,000 | 12,063,083 | 5,487,167 | 17,944,713 | 10,708,000 | 8,872,630 | 4,900,161 | 11,406,155 |
| | එකතුව | 21,629,500 | 24,577,232 | 16,291,455 | 21,496,388 | 21,607,000 | 17,659,369 | 12,692,547 | 14,459,680 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>ආරම්භක හිඟ වරිපනම් ගාස්තු වූ රු.1,160,656 කින් වර්ෂය අවසන් වන විට රු.642,224 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අය කර ගත යුතු වේ. | නීතිමය කටයුතු කර, හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | **කසල බදු**<br>සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු මුළු කසළ බදු ආදායම වූ රු.1,470,470 න් රු.865,820 ක මුදලක් අය කර ගෙන නොතිබුණි. | හිඟ කසළ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ අය කර, වාර්තා කරන බවත්, සාවද්‍ය බිල් කිරීම මත ඇති වූ හිඟයන් කපා හැරීමටත් කටයුතු කරමි. |
| (ඇ) | **ජල ගාස්තු**<br>ආරම්භක හිඟ ජල ගාස්තු වූ රු.492,902 ක මුදලින් රු.295,160 ක් හා නව ජල සම්බන්ධතා ලබා දුන් පාරිභෝගිකයින් 23 දෙනෙකුගෙන් අය විය යුතු රු.64,795 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු හා ජල සම්බන්ධතා ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | අක්‍රීය වූ ජල යෝජනා ක්‍රමවල හිඟ ජල ගාස්තු කපා හැරීමට කටයුතු කරමි. |
| (ඈ) | **ත්‍රිරෝද රථ ගාස්තු**<br>වර්ෂයේ ආරම්භක දිනට පැවති හිඟ ත්‍රිරෝද රථ ගාස්තු වූ රු.1,220,785 ක මුදලින් රු.951,585 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ ත්‍රිරෝද රථ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ත්‍රිරෝද රථ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------- |
| (අ) | හතරලියද්ද ලංකා බැංකුව අසල පිහිටි කඩ කාමර 06 සඳහා ලබා ගත් නව තක්සේරුව මත කඩ කුලී සංශෝධනය කර නොතිබූ බැවින්, රු.62,700 ක ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කුලී සංශෝධනය කිරීම මගින් සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී, තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ගලගෙදර මඩිගේ වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ අංක 04 කඩ කාමරයෙන් අය විය යුතු රු.145,300 ක කඩ කුලී ආදායම අය කර නොතිබුණි. | සභාව සතු කඩ කාමරවලින් අය විය යුතු හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය කර ගැනීම සම්බන්ධව ගැටළුසහගත තත්ත්වයක් පවතී. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------- | ------------------------------- |
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,525,908 ක් හා මුද්දර ගාස්තු රු.15,104,370 ක් විය. | සභාවට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල් ලබා ගැනීම සඳහා උපලේඛන ඉදිරිපත් කර ඇති අතර, මුද්දර ගාස්තු උපලේඛන එවීමට කටයුතු කරන බව දන්වා ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------- |
| (i) | 2014 වර්ෂයේ ආරම්භ කළ සුජාතා බාලිකා විදුහල ඉදිරිපිට වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.2,076,510 ක පිරිවැයක් දරා ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. | ව්‍යාපෘතිය අවසන් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ii) | 2010 වර්ෂයේ රු.350,000 ක වියදමක් දරමින් ආරම්භ කළ සිමෙන්ති බීම් ඇතුරුම් ගල් ව්‍යාපෘතිය 2014 වර්ෂයේ සිට අත් හැර දමා තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | නිෂ්පාදනය වන ගල් ප්‍රමාණය අඩුකම මත එම ව්‍යාපෘතිය අත්හැර දමා ඇත. |

(ආ) කර්තව්‍යයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ණය සංවර්ධන අරමුදලින් 2014 වර්ෂයේ ලබා ගත් රු.8,000,000 ක ණය මුදලින් අපේක්ෂා කළ ගලගෙදර සුජාතා බාලිකා විද්‍යාලය ඉදිරිපිට පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම හා නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් පවරා ගැනීම යන කාර්යයන් ඉටු නොකර සමාලෝචිත වර්ෂය අවසානයට ණය මුදල සඳහා ගෙවා තිබූ රු.567,293 ක් වූ පොලී මුදල සභා අරමුදලට සිදු වූ පාඩුවක් ලෙස නිරීක්ෂණය විය. | ණය ලබා ගත් කාරණය සඳහා අදාළ මුදල් යෙදවීමට කටයුතු කළ යුතු වේ. | ලබා ගත් ණය මුදලින් කොටසක් නැවත මෙම වසරේ දී, නිදහස් කර ඇති අතර, ඉතිරි ණය මුදලින් අදාළ ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | බල ප්‍රදේශය තුළ එකතු වන කසළ කළමනාකරණයකින් තොරව අවිධිමත්ව දික්ඔයවත්ත නමැති ඉඩකමකට බැහැර කරමින් පැවතුණි. | සභාව විසින් විධිමත් කසළ කළමනාකරණයට යොමු විය යුතු වේ. | සති 02 කින් පමණ අට්ටි ගසා කොම්පෝස්ට් වූ පසු කාර්යාලයීය ගෙවතු වගාව සඳහා යොදා ගනිමි. |
| (ii) | ක්‍රියාත්මක සැලැස්ම අනුව, කොම්පෝස්ට් කැබලි කරන යන්ත්‍රයක් හා හලන යන්ත්‍රයක් මිල දී ගෙන, අළෙවිය සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය සැලසුම් කර තිබුණ ද, එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | ක්‍රියාත්මක සැලැස්ම අනුව, කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ යුතු වේ. | යන්ත්‍ර සපයා ගැනීමට නොහැකි විය. |

(ඈ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නොදිරන කසළ අතර ඇති පොලිතීන්, ප්ලාස්ටික් වැනි ද්‍රව්‍ය සඳහා පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙලක් අනුගමනය කිරීමකින් තොරව කසළ අංගනය තුළ දහනය කරමින් පැවතුණි. | පාරිසරික ගැටළු අවම වන පරිදි කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. | ඉදිරියේ දී, කසළ දහනය සඳහා අවශ්‍ය යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක | තිරසර සංවර්ධන | විගණන හා |

| | | |
|---|---|---|
| කරා ලඟාවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අරමුණු හා ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | කළමනාකරණ කමිටුවේ දී, ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී, සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘති 02 ක් සමාලෝචිත වර්ෂය වන විට අක්‍රීය වී තිබූ අතර, ප්‍රතිලාභ ලැබූ පාරිභෝගිකයින් 16 දෙනෙකුගෙන් අය විය යුතු රු.50,370 ක මුදලක් ද අය කර ගෙන නොතිබුණි. | අය විය යුතු මුදල් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) | සභාවේ ජල යෝජනා ක්‍රම 06 ක ජලය ගුණත්වයෙන් තොර බවට ක්ෂුද්‍රජීවී පරීක්ෂණය මඟින් සනාථ වී තිබුණ ද, ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය නොකර, බීම සඳහා ජලය බෙදා හරිමින් පැවතුණි. | සභාවේ ජල යෝජනා ක්‍රමවලින් බෙදා හරින ජලය සතුටුදායක මට්ටමින් ඇති බවට සනාථ කර ගත යුතු වේ. | ජලය බීමට නුදුසුදු බවට වාර්තා සභාව වෙත ලැබී නොමැත. |
| (ඇ) | 2012 වර්ෂයේ දී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත රු.500,000 ක බදු අත්තිකාරම් මුදලක් ගෙවා කසළ බැහැර කිරීම සඳහා දික්ඔයවත්ත ඉඩම ලබා ගෙන තිබුණ ද, විධිමත් බදු ඔප්පුවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් බදු ඔප්පුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙතෙක් ලබා ගෙන නොමැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>-----------------------------------<br>අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 24 ක් පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු 10 ක් පමණ මේ වන විට පුරවා ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු ජල යෝජනා ක්‍රම 06 ක ජලය පිරිසිදු කිරීමකින් තොරව පාරිභෝගිකයින් 427 ක් වෙත බෙදා හරිමින් පැවතුණි. | බෙදා හරින ජලය පිරිපහදු කිරීමක් සිදු කළ යුතු වේ. | ජලය පිරිපහදුව සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීමට සභාවට මූල්‍යමය හැකියාවක් නොමැත. |
| (ආ) | හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ පළමු ගොඩනැගිල්ලේ බිම් මහලේ ඉදිරිපස අංක 02 කඩ කාමරය ලංසු ඉදිරිපත් කර | කඩ කාමර බදු දීමේ දී, විනිවිදභාවයකින් යුතුව කටයුතු කළ | විගණනය විසින් පෙන්වා දුන් අඩුපාඩුව පිළිගනිමි. |

| | | |
|---|---|---|
| නොතිබූ සභාවේ සභික මහතෙකුට අවිධිමත්ව බදු දී තිබුණි. | යුතු වේ. | |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

3.5.1 <u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හතරලියද්ද වෙළඳ සංකීර්ණයේ දෙවන ගොඩනැගිල්ලේ බිම් මහලේ පසු පස අංක 28 කඩ කාමරයේ පෙර බදු ගිවිසුම 2016 ජූනි 14 දින අවලංගු කර අවුරුදු 02 යි මාස 04 ක් ගත වන තුරු නැවත බදු දී නොතිබුණි. | කඩ කාමර නැවත බදු දී, සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | බදුකරු විසින් ගිවිසුමේ සඳහන් පරිදි නිරවුල් භුක්තිය සභාව වෙත ලබා දීමට කටයුතු කර නොමැති බැවින්, සන්තකය පවරා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇත. |

3.5.2 <u>නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.611,719 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 07 ක් වසර 01 ත් වසර 18 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිතව පැවතුණි. | සභාව සතු වත්කම් නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත තත්ත්වයට පත් වීමට ඉඩ නොතැබිය යුතු වේ. | වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2010 වර්ෂයේ සිමෙන්ති බිම් ඇතුරුම් ගල් ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් රු.124,319 ක් වටිනා යන්ත්‍රය 2014 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත තත්ත්වයට පත් වීමට ඉඩ නොහැරිය යුතුය. | වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

3.6 <u>ප්‍රසම්පාදනය</u>

3.6.1 <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |

3.6.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුජාතා බාලිකා විද්‍යාලයේ ඉදිරිපිට වෙළඳ සංකීර්ණයේ සංවර්ධන කටයුතු සඳහා 2014 වර්ෂයේ දී, ගෙවූ රු.883,333 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කිරීමට හෝ ගිවිසුම සමාප්ත කිරීමට කටයුතු කරමි. |